# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2260/63 - 2021 දෙසැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2021.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/98 (ii) A

**1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත**

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15 වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 53 වන වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

විමල් වීරවංශ,
කර්මාන්ත අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2021 ජුනි මස 18 වැනි දින අංක 2232/36 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධිත, 2020 මාර්තු මස 2 වැනි දින අංක 2165/2 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2020 අංක 1 දරන මැණික් සහ ස්වර්ණාභරණ (බලපත්‍ර ගාස්තු) නියෝගවල උපලේඛනයේ අනුක්‍රමික අංකය යන ශීර්ෂය යටතේ 13.1, 13.4 සහ 13.8 සහ ඊට අනුරූපීව පිළිවෙලින් "විස්තරය" සහ

1A - PG 5674 -510 (2021/12)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

"ගාස්තු" ශීර්ෂ යටතේ I වන තීරයේ සහ II වන තීරයේ සටහන් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

| | I වන තීරය | II වන තීරය | |
|---|---|---|---|
| අනුක්‍රමික අංකය | තොරතුරු | ගාස්තු | |
| | | මාර්ගගත | භෞතික |
| 13.1 | (i) මැණික් සහ ස්වර්ණාභරණ තොග අපනයනය (සම්පූර්ණ නැව්ගත වටිනාකම ඇ.ඩො. 200ට අඩු | ගාස්තුවලින් නිදහස් | ගාස්තුවලින් නිදහස් |
| | (ii) මැණික් සහ ස්වර්ණාභරණ තොග අපනයනය (සම්පූර්ණ නැව්ගත වටිනාකම ඇ.ඩො. 201 සහ ඇ.ඩො. 1000 අතර (ඒ දෙකද ඇතුළත්ව)) | රු. 500/- | රු. 1,000/- |
| | (iii) මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය (සම්පූර්ණ නැව්ගත වටිනාකම ඇ.ඩො. 1001 සහ ඇ.ඩො. 3000 අතර (ඒ දෙකද ඇතුළත්ව)) | රු. 1,500/- | රු. 3,000/- |
| | (iv) මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය (සම්පූර්ණ නැව්ගත වටිනාකම ඇ. ඩො. 3001ට වැඩි) | කරගෙන යාමට අවසර හිමි නොවේ | අපනයනය ඉන්වොයිසියේ සම්පූර්ණ නැව්ගත වටිනාකමෙන් 0.25%ක් සහ රු. 2,000/- වේ. |
| 13.4 | ප්‍රදර්ශන සඳහා අපනයන සේවා ගාස්තු නිදහස් කිරීමේ පහසුකම් - පරිපාලනය ගාස්තු | අයිතම නැවත ලැබීමෙන් පසු විකුණන ලද අයිතම්වල සම්පූර්ණ නැව්ගත වටිනාකම මත 0.25%ක උපරිමයක් වන පරිදි ගණනය කළ, කලින් ගෙවිය යුතු ගාස්තුවක් ලෙස රු.15,000/- අය කළ යුතු ය.<br><br>සත්‍ය වශයෙන් ගෙවිය යුතු ගාස්තුව රු. 15,000/- ක් හිලව් කළ යුතු ය.<br><br>(සම්පූර්ණ නැවත ලැබීමක දී හෝ සත්‍ය වශයෙන් ගෙවිය යුතු ගාස්තුව රු. 15,000/- වඩා අඩු වන විට ඒ මුදල රඳවා ගත යුතු ය.) | |
| 13.8 | සම්පූර්ණ නැවත ලැබීම් සඳහා (පුද්ගලික ප්‍රදර්ශන කාණ්ඩයේ පාර්සල්) | රු. 3,000/-<br><br>අපනයන දිනයේ සිට දින 180ක් ඇතුළත අදාළ අපනයනය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක ඉන්වොයිසියේ සම්පූර්ණ නැව්ගත වටිනාකමෙන් 0.5%ක් අයකළ යුතු ය. | |

EOG 12 - 0342

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.